එනතු இல. / My No. එම / 01 / 42   08/2006

ඔබේ අංකය / உமது இல. / Your No.

දුරකථන අංක / தொலைபேசி இல. / Telephone Nos. 2393071, 2393072

ෆැක්ස් අංකය / பெக்ஸ் இல. / Fax No. 2393074

ඊමේල් / ஈ - மெயில் / E-mail rgdept @ sltnet. lk


රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව
பதிவாளர் நாயகம் திணைக்களம்
REGISTRAR — GENERAL'S DEPARTMENT

ප්‍රධාන කාර්යාලය
தலைமை அலுவலகம்
HEAD OFFICE


තැ. පෙ. අංකය / த. பெ. இல. / P. O. Box No. 565

280, කෙළින් වීදිය, කොළඹ 11.
280, பிரதான வீதி, கொழும்பு 11.
280, Main Street, Colombo 11.


දිනය/ திகதி/ Date 2006.08.30

සියලුම දිස්ත්‍රික් ලේකම්වරු / අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් වෙත,

## විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමේ පරිපාටිය සංශෝධනය කිරීම - 2006 වර්ෂය

ගරු රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යතුමා විසින්, රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු ලේකම්ගේ අංක ABD / BR / පොදු (XV) හා 2006.08.10 දිනැති ලිපියෙන් අනුමත කළ බව මා වෙත දන්වා එවන ලද විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවා ගැනීමේ සංශෝධිත පරිපාටියේ පිටපතක් මේ සමඟ ඔබ වෙත එවමි. මෙම සංශෝධිත පරිපාටිය වහාම ක්‍රියාත්මක වේ.

02. මෙම සංශෝධන මගින් විවාහ, උප්පැන්න හා මරණ රෙජිස්ට්‍රාර්වරුන් බඳවාගැනීම සඳහා මෙතෙක් අනුගමනය කළ ක්‍රියාමාර්ගවල පහත සඳහන් වෙනස්කම් සිදුකර ඇත.

| දැනට ඇති ප්‍රතිපාදන | නව සංශෝධන |
|---|---|
| 1. (i) **බඳවා ගැනීමේ වයස :-**<br>අයදුම්කරුවන්ගේ වයස අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට අවු. 21 ට නොඅඩු විය යුතු අතර අවු. 60 නොඉක්මවිය යුතුය.<br>(ii) **විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස** අවු. 75 විය යුතුය. | අයදුම්කරුවන්ගේ වයස අයදුම්පත් කැඳවීමේ අවසාන දිනයට අවු. 21 ට නොඅඩු විය යුතු අතර අවු. 65 නොඉක්මවිය යුතුය.<br>**(iii) විශ්‍රාම ගැන්වීමේ උපරිම වයස අවු. 70 විය යුතුය.** |
| 2. **ලකුණු දීමේ ක්‍රමය :-**<br>(අ) චරිතය / සමාජතත්වය / ජනප්‍රසාදය / ආදායම තත්වය - ලකුණු 20<br>(ආ) වැඩ බලන රෙජිස්ට්‍රාර්වරුන්ගේ සේවා කාලයට ලකුණු දුන්නේ නැත. | (අ) චරිතය / සමාජතත්වය / ජනප්‍රසාදය / ආදායම තත්වය - **ලකුණු 15**<br>(ආ) වැඩ බලන රෙජිස්ට්‍රාර්වරුන් සඳහා - **ලකුණු 05**<br>(වර්ෂයකට වැඩි වැඩ බලන කාලයක් සඳහා ලකුණු 05 ක් ද<br>වර්ෂයකට අඩු එහෙත්, මාස 06 කට වැඩි නම ලකුණු 03 ක් ද දෙනු ලැබේ).<br>(ආදේශකයන් සඳහා ලකුණු දෙනු නොලැබේ.) |

03. මෙම නව බඳවා ගැනීමේ ක්‍රමය හොඳින් අධ්‍යයනය කර ඉදිරියේදී පවත්වනු ලබන සියලුම සම්මුඛ පරීක්ෂණවලදී මේ අනුව කටයුතු කිරීමට ඔබගේ අදාල නිලධාරීන්ට කරුණාකර උපදෙස් දෙන්න.

රෙජිස්ට්‍රාර් ජනරාල්
එල්. එස්. රත්නායක
රෙජිස්ට්‍රාර් ජනරාල්

පිටපත් :- 1. ලේකම් , රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය - දැනගැනීම සඳහා
2. ආයතන අධ්‍යක්ෂ ජනරාල් - දැනගැනීම සඳහා
3. සියලුම කළාප භාර සහකාර රෙජිස්ට්‍රාර් ජනරාල්වරුන් - දැනගැනීම සඳහා
4. සියලුම ඉඩම් හා අතිරේක දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර්වරුන් - අවශ්‍ය කටයුතු සඳහා
5. සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන් - දැනගැනීම හා අවශ්‍ය කටයුතු සඳහා